සැ. යු. - (i) 2018.05.04 වැනි දින පළ වූ අංක 2,070 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

(ii) මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2018 වර්ෂය සඳහා ගාල්ල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, ඉංග්‍රීසි, දෙමළ භාෂාවන්ගෙන් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,071 - 2018 මැයි මස 11 වැනි සිකුරාදා - 2018.05.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 270 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* - 1990 සුවසැරිය පදනම පනත් කෙටුම්පත 2018 අප්‍රේල් මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2018 ජුනි මස 01 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 මැයි මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීම

කොළඹ දිසා අධිකරණයේ දී ය.

*නඩු අංකය* : 17511/MB
ගාල්ල දිසා අධිකරණ
ඇස්කීසි අංකය : 71/2017.

කොළඹ 2, හයිඩ්පාක් කෝනර්, අංක 97, පෙර කොළඹ 1, ජනාධිපති මාවතේ, අංක 69, සෙලින්කෝ මන්දිරයේ, 3 වැනි මහලේ පිහිටි සීමාසහිත ද ෆිනෑන්ස් සමාගම, ද ෆිනෑන්ස් කම්පැණි ලිමිටඩ්.

.......................................*පැමිණිලිකරු.*

*එදිරිව*

(1) වලස්මුල්ල, ඇත්පිටිය, අංක 1/469 හි පදිංචි, නම්මුනි ආරච්චිගේ චන්ද්‍රපාල දනට පූජ්‍ය ඇත්පිටියේ චන්ද්‍රානන්ද හිමි, 8 වන මාවත, නවගම්පුර, අම්පාර.

(2) වලස්මුල්ල, ඇත්පිටිය, අංක 1/469 හි කාරියවසම් මානගේ ජයතිස්ස.

.......................................*විත්තිකරුවන්.*

ඉහත අංක දරන නඩු වාර්තාවේ ඇතුලත් කර ඇති වර්ෂ 2006.12.14 දිනැති තීන්දු ප්‍රකාශය මගින් ඉහත විත්තිකරුගෙන් පැමිණිලිකරුට රුපියල් 1,069,582.13 මුදලක් වර්ෂ 2004.06.16 වැනි දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා මසකට 24%ක් බැගින් පොලිය ද, එතැන් සිට තීන්දු ප්‍රකාශිත මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමවන තෙක් සමස්ථ මුදල සඳහා පොලිය ද, නඩු ගාස්තු ද ඒ සඳහා තවදුරටත් පොලිය හා ගාස්තු අයකර ගැනීමට ආඥාකොට ඇති බැවින් ද,

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එච්. එම්. සී. උඩබාගේ විසින් සහතික කළ වර්ෂ 2003.08.23 දිනැති අංක 132 දරන බැඳුම්කරය පදනම් කරගෙන ඉහත කී රු. 10,69,582.13ක මුදල හා වැඩිදුර පොලිය ද, නඩු ගාස්තු ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති දේපල එකී පහත විස්තර කර ඇති දේපලට අයත් සියලුම අයිතිවාසිකම් පරවශ්‍යතා සහ අනුබද්ධිතයින් ද, විත්තිකරුවන්ගෙන් කවර ආකාරයන් හෝ සියලු අයිතිවාසිකම් හිමිකම්, බලපුලුවන්කාරකම් හිමිකම්පෑම් සහ ඉල්ලීම් ද මෙහි උපලේඛනයේ හා පැමිණිල්ලේ උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපලෙන් උපදන සහ එකතු වන සියලු කුලී ලාභ සහ අනිකුත් ආදයම් ද සියලු ගිවිසුම් සහ රක්ෂණ ගිවිසුම් ද ඇතුලුව මෙහි උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති එකී දේපල නිශ්චිතවම බැඳී ඇති බව හා ඇස්කීසි කළහැකි බව ප්‍රකාශ කරන ලද හෙයින් ද, අධිකරණයෙන් නියම කරන ලද කොන්දේසි වලට යටත්ව පහත උපලේඛනයෙහි විස්තර කර ඇති දේපල වර්ෂ 2018ක් වූ ජුනි මස 14 වැනි දින ප. ව. 2.00 ට ඉඩමේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී වෙන්දේසියේ දී ඉහලම ලංසු තබන්නා ගැනුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැනුම්කරු විසින් මුළු ගැනුම් මිලෙන් 25%, මුදලක් ද, පිස්කල් ගාස්තු ද රජයට අයවිය යුතු ගාස්තු (පවුන්ඩ්ජ් ගාස්තු) තක්සේරු ගාස්තු, වෙන්දේසි ගාස්තු, *ගැසට් පත්‍රයේ* ගාස්තු සහ පුවත්පත්වල ප්‍රසිද්ධ කිරීමේ වියදම් ද, අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වූ වියදම් ද එවලේම මුදලින් මා වෙත ගෙවිය යුතු ය. චෙක්පත් බාරගනු නොලැබේ. ගැනුම් මිලෙන් 75%ක ඉතිරි මුදල දින 30ක් ඇතුලත කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතු ය.

*දේපලට පිවිසුම් මාර්ගය.*-අහංගම නගරයේ සිට ඉමදූව පාරේ, මීටර් 50ක් පමණ ගිය පසු දුම්රිය මාර්ගය අසලින් දකුණට හැරී මුණිඳුස මාවතේ, කි. මී. 1ක් පමණ ඉදිරියට ගොස් ධර්මාරාම පාසැල පසුකර තවත් මීටර් 25ක් පමණ ඉදිරියට යන විට එම පාරේ වම් අත පැත්තේ මෙම දේපල පිහිටා ඇත.

### ඉහත කී උපලේඛනය

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, තල්පේ පත්තුවේ, හබරාදුව ප්‍රාදේශීය සභා සීමාවේ, අහංගම හතුව හබරාදුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ, අංක 160 පියදිගම නැගෙනහිර ග්‍රාම නිළධාරී වසමේ පිහිටි වෙරෙන්ටෙවත්ත නමැති ඉඩමේ 1990ක් වූ මැයි මස 31 වැනි දින එන්. ජී. ඩී. යූ. කරුණාරත්න ගාල්ල බද්දේගම බලයලත් මිනින්දෝරු තැන විසින් මැන පිළියෙල කරන ලද අංක 13 දරන සැලැස්ම ප්‍රකාර කැබලි අංක A, B, C ඒකාබද්ධ කළ ඉඩමෙන් බෙද වෙන්කළ කැබලි අංක 1ට මායිම් උතුරට ගෙවත්ත ද, නැගෙනහිරට : මුනිදස මාවතට හා රැවුලන්නේ මාලපලාවට ප්‍රවේශය ද, දකුණට ලුසිගමගේවත්ත හා බටහිරට : කහටගහවත්ත ද යන මෙකී මායිම් තුළ පිහිටි

රූඩ් දෙකයි පර්චස් දහසයයි දශම එකක් (අ. 0, රූ. 2, පර්. 16.1) ක් විශාල ඉඩම හා එය තුළ පිහිටි සියලු ගොඩනැගිලි ගහකොළ පළතුරු ඇතුළු සියලු දේ ද සමග වේ. මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඩී 865/201 හි ලියාපදිංචි කර ඇත.

රෙජිස්ට්‍රාර්/නි. පිස්කල්,
දිසා අධිකරණය - ගාල්ල.

වර්ෂ 2018ක් වූ අප්‍රේල් මස 20 දින දී ය,
ගාල්ල දිසා අධිකරණයේ දී ය.

05-242